චක්‍රලේඛ අංක :07/2015

මගේ අංකය : 1/6/1

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ:ප:),

අංක 109 , හතර වන මහල,

මහ වීදිය ,

බත්තරමුල්ල.

2016-01- 01

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති,

සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

## සණස අභ්‍යන්තර විගණක තනතුර ස්ථාපිත කිරීම.

සණස සමිති වල දෛනික කටයුතු පරීක්ෂා කොට අභ්‍යන්තර විගණනය සිදු කිරීම තුළින් එම සමිතිවල සිදුවන වංචා දූෂණ අවම කර ගැනීම සහ සමිති නිසි ගිණුම් තැබීමට ලක් කොට දෙපාර්තමේන්තු විගණන කලට වේලාවට සිදුකර ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් කරන ලද ඉල්ලීම මෙම කොමිෂන් සභාවේ අවධානයට ලක්කිරීමෙන් අනතුරුව දැනට බඳවා ගැනීමේ පරිපාටියේ ඇති අනු අංකය 30 යටතේ ඇති 103:7 විගණන සහකාර තනතුර සණස අභ්‍යන්තර විගණක / විවිධ සේවා සමුපකාර විගණන සහකාර ලෙස සංශෝධනය කර සෑම සණස සමිතියක් සඳහාම 2016/01/01 දින සිට සණස සමිති අභ්‍යන්තර විගණන තනතුරක් ඇති කිරීමට කටයුතු කර ඇත.

එබැවින් මෙම තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් අදාල කර ගන්නා ලෙස සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

1) තනතුරේ නම : සණස අභ්‍යන්තර විගණක III

වැටුප් පරිමාණ අංකය : 104:09 (2/2010 චක්‍රලේඛය පරිදි)

අවම වයස් සීමාව : අවුරුදු 21

උපරිම වයස් සීමාව : අවුරුදු 45

**තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) 104:09 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) ස්ථිර තනතුරක වසර 05 ක් හෝ 104:08 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) ස්ථිර තනතුරක වසර 03 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(ආ) අ:පො:ස: (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණය ඇතුළු වාණිජ විෂයය දෙකකට සම්මාන සහිතව සමත් වීම හෝ සමුපකාර (උ/පෙළ) විභාගයෙන් සමත්වීම

**විශේෂ සුදුසුකම්**

ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ අන්තර්මධ්‍ය පරීක්ෂණය II මට්ටම සමත්වීම හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම විශේෂ සුදුසුකම් වේ.

**සේවා කොන්දේසි**

පරිවාස කාලය ඇතුළත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර විගණනය පිළිබඳ එක් මසකට නොඅඩු පාඨමාලාව හදාරා තිබීම අනිවාර්ය වේ.

2) තනතුරේ නම : සණස අභ්‍යන්තර විගණක II

වැටුප් පරිමාණ අංකය : 104:08 (2/2010 චක්‍රලේඛය පරිදි)

අවම වයස් සීමාව : අවුරුදු 21

උපරිම වයස් සීමාව : අවුරුදු 45

තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(අ) 104:09 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) ස්ථිර තනතුරක වසර 10 ක් හෝ 104:08 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) ස්ථිර තනතුරක වසර 08 ක හෝ 104:09 වැ.ප. සණස අභ්‍යන්තර විගණක ස්ථිර තනතුරක වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ

ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ 11 මට්ටම සමත්වීම හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම

හෝ

(ආ) අ:පො:ස: (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණය ඇතුළු වාණිජ විෂයය දෙකකට සම්මාන සහිතව සමත් වීම හෝ සමුපකාර (උ/පෙළ) විභාගයෙන් සමත්වීම සහ පිළිගත් ආයතනයක විගණන කටයුතු පිළිබඳ එක් වසරක පලපුරුද්ද සහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ 1 මට්ටම සමත්වීම

**සේවා කොන්දේසි**

පරිවාස කාලය ඇතුළත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර විගණනය පිළිබඳ එක් මසකට නොඅඩු පාඨමාලාව හදාරා තිබීම අනිවාර්ය වේ.

3) තනතුරේ නම : සණස අභ්‍යන්තර විගණක I

වැටුප් පරිමාණ අංකය : 103:07 (2/2010 චක්‍රලේඛය පරිදි)

අවම වයස් සීමාව : අවුරුදු 21

උපරිම වයස් සීමාව : අවුරුදු 45

**තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) 104:09 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) / සණස අභ්‍යන්තර විගණක ස්ථිර තනතුරක වසර 12 ක් හෝ 104:08 වැ.ප. කළමනාකරණ සහකාර (විගණන) ස්ථිර තනතුරක වසර 10 ක හෝ 104:08 වැ.ප. සණස අභ්‍යන්තර විගණන / විගණන සහකාර ස්ථිර තනතුරක වසර 08 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ

ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ 111 මට්ටම සමත්වීම හෝ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අන්තර්මධ්‍යම පරීක්ෂණය සමත්වීම හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම සහ පිළිගත් ආයතනයක විගණනය පිළිබඳ වසර දෙකක පලපුරුද්ද

හෝ

(ආ) අ:පො:ස: (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණය ඇතුළු වාණිජ විෂයයන් සියල්ලටම සම්මාන සහිතව සමත් වීම හෝ සමුපකාර (උ/පෙළ) විභාගයෙන් සමත්වීම හෝ පිළිගත් ආයතනයක විගණන කටයුතු පිළිබඳ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ 111 මට්ටම සමත්වීම හෝ-ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ අන්තර්මධ්‍යම පරීක්ෂණය සමත්වීම

**සේවා කොන්දේසි**

පරිවාස කාලය ඇතුළත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර විගණනය පිළිබඳ එක් මසකට නොඅඩු පාඨමාලාව හදාරා තිබීම අනිවාර්ය වේ.

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන හා වෙළඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
4. සමුපකාර සංවර්ධන සහකර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
7. සියළුම සමුපකාර සේවක වෘත්තීය සමිති .